පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **06**

# දෙවන වාර පරීක්ෂණය - 2019

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I , II

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ....................................................
....................................................

කාලය : පැය **02** යි.

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නූතන සිංහල අක්ෂර මාලාවේ ස්වර අක්ෂර ගණන වන්නේ ,

1. 20 කි  2. 60 කි  3. 18 කි  4. 42 කි

02. මුලට ව්‍යංජන අක්ෂරයක් පමණක් යෙදී ඇති වචනය තෝරන්න.

1. ඇතා  2. කරඬුව  3. ඒදණ්ඩ  4. ඉබ්බා

03. "රූකඩ" යන වචනයෙහි ඇතුළත් පිල්ලම වන්නේ ,

1. ඇදපිල්ල  2. දිගු ඇදපිල්ල  3. පාපිල්ල  4. දිගු පාපිල්ල

04. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

1. තරුනයා  2. පිළිතුර  3. ප්‍රශ්ණ  4. ඇතුල

05. මහාප්‍රාණ අක්ෂරයක් යෙදී නොමැති වචනය තෝරන්න.

1. පරිගණකය  2. අන්ධ  3. සංඝයා  4. ඡන්දය

06. පහත සඳහන් වචන අතුරෙන් ඒක වචනයක් වන්නේ ,

1. මුහුද  2. කඳු  3. පාසල්  4. වනාන්තර

07. දී ඇති වචන අතරින් උක්ත පදය තෝරන්න.

1. සතෙකු  2. දරුවෙක්  3. මුවන්  4. ගුරුවරියක

08. ස්ත්‍රී ලිංග අනුක්ත නාම පදය තෝරන්න.

1. බිසවක්  2. නිළියෝ  3. ඇතින්නියක්  4. නායිකාවක

09. ප්‍රථම පුරුෂ බහුවචන උක්ත පදය තෝරන්න.

1. තොප  2. මා  3. අපි  4. ඔවුහු

10. "**පිරිසිදු**" යන වචනයෙහි විරුද්ධාර්ථ පදය වන්නේ ,

1. පවිත්‍ර  2. සුපිරිසිදු  3. අපිරිසිදු  4. පිවිතුරු

11. "**දොම්නස**" යන පදයට සමාන අර්ථයක් දෙන පදය තෝරන්න.

1. දුක  2. සතුට  3. සැනසුම  4. සොම්නස

Education NCP - www.edncp.lk

- **12 සහ 13 වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පදය තෝරන්න.**

12. නුඹ ඊයේ සවස ගමට ____________________

1. ගියේ ය.  2. ගියෙහි  3. යන්නෙහු  4. ගියෙහු

13. නැඟණිය ගීතය හොඳින් ගායනා ____________________

1. කළා ය.  2. කළේ ය.  3. කළහ  4. කරති

- **14 හා 15 වාක්‍යවල හිස්තැන්වලට ගැළපෙන උක්ත පදය තෝරන්න.**

14. ____________________ වනාන්තර විනාශ කරති.

1. මිනිසෙක්  2. මිනිස්සු  3. මිනිසුන්  4. මිනිසෙකු

15. ____________________ තරගයට සහභාගී වන්නෙමු.

1. මම  2. ඔහු  3. අපි  4. ඔවුහු

16. "පාසල් යන දරුවෝ බොහෝ දෙනෙක් හොඳ දරුවෝ වෙති " මෙහි යෙදී ඇති නාම විශේෂණ පදයක් වන්නේ,

1. පාසල්  2. දරුවෝ  3. වෙති  4. හොඳ

- **17 හා 18 වාක්‍යවල ඇතුළත් විරාම ලක්ෂණ තෝරන්න.**

17. ඔබගේ සැප දුක් කෙසේ ද ?

1. තිත  2. ප්‍රශ්නාර්ථ ලකුණ  3. විස්මයාදි ලකුණ  4. කොමාව

18. සුබ උපන්දිනයක් වේවා !

1. විස්මයාදි ලකුණ  2. තිත  3. ප්‍රශ්නාර්ථ ලකුණ  4. දෙතිත

19. "කොට්ට වෙලා " යන පදයේ සාමාන්‍ය අර්ථය වන්නේ ,

1. හොඳින් පෙඟිලා  2. නරක් වෙලා  3. අධික ලෙස වේළිලා  4. හොඳට ඉදිලා

20. "සුදහ ගින්දර " යන වචනයෙහි අර්ථය වන්නේ ,

1. උණුසුම  2. පිපාසය  3. වෙහෙස  4. බඩගින්න

(ලකුණු 2 x 20 = 40)

# II කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් මාතෘකා අතුරෙන් එක් මාතෘකාවක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

i. වැඩිහිටියන්ට සලකමු.
ii. මා දුටු මුහුදු වෙරළ.
iii. පරිසරය සුරකිමු.
iv. පොදු දේපළ ආරක්ෂා කරමු.

(ලකුණු 20)

Education NCP - www.edncp.lk

02. පෙළ පොතෙහි එන පාඩම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. "දැන් ඉතින් අපට මේ විල රකගෙන ඉඳලා ඇති කාරියක් නෑ"
   (අ) මෙසේ පවසන්නේ කවුරුන් ද?
   (ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?
   (ඇ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කුමක් ද?

ii. "ඒකාන්තයෙන් මේ අමනුෂ්‍ය පරිගෘහිත වූ පොකුණක් වුව මැනව යි"
   (අ) මෙසේ ප්‍රකාශ කළේ කවරෙක් ද?
   (ආ) මෙම ප්‍රකාශය අයත් ජාතක කතාව කුමක් ද ?
   (ඇ) පන්සිය පනස් ජාතක පොත ලියැවුණු සාහිත්‍ය යුගය නම් කරන්න.

iii. එගොඩ ගොඩේ නා කණුවේ බැන්ද    ගොනා
මෙගොඩ ගොඩේ සපු කණුවේ බැන්ද    ගොනා
දෙගොඩ තලා යන වතුරට පැන්න    ගොනා
......................................................................................

   (අ) ඉහත කවියේ අවසන් පද පේළිය සම්පූර්ණ කරන්න.
   (ආ) ඉහත කවිය කුමන ජන කවි වර්ගයට අයත් වේද?
   (ඇ) ඔබ දන්නා වෙනත් ජන කවි වර්ග දෙකක් ලියා දක්වන්න.

iv. "හැම අතින්ම කොළයකට සමාන බැවින් බොහෝ දෙන මේ සතුන් කොළවලින් හට ගනිති'යි විශ්වාස කරති. එය වැරදි විශ්වාසයකි "
   (අ) එසේ නම් මේ සත්වයින් හටගන්නේ කෙසේ ද ?
   (ආ) මෙම විස්තරය ඇතුළත්වන පාඩම කුමක් ද ?
   (ඇ) එම පාඩම උපුටාගත් කෘතිය නම් කරන්න.

v. "හනික, හනික බලා ඉන්ට කල් නෑ අප හැම ම බඩගින්නේ ..........."
   (අ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් ද?
   (ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?
   (ඇ) මෙම පාඩමෙන් ඉදිරිපත් වන්නේ කුමන ජන කොටසක් ගැන ද?

(ලකුණු 3 × 5 = 15)

03. පහත සඳහන් පද්‍ය පන්තිය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සීගිරියේ බිතු සිතුවම්
ඉසුරුමුණියේ ගල් කැටයම්
සිරි ඉතිරේ අනුරපුරේ
යුගයක හෙළ විරු විකුමන්

වැවෙන් ජලය කෙතට හලා
ගලෙන් විකුම් පිළිම නෙළා
පොලොන්නරුවෙ හෙළ විරුවන්
රුවන් දෙරණ සසිරි කළා

i. බිතු සිතුවම් ඇත්තේ කොහේ ද ?
ii. ඉසුරුමුණියේ තිබෙන්නේ මොනවා ද ?
iii. කෙත්වලට ජලය ලබා ගන්නේ කුමකින් ද ?
iv. කවි පන්තියේ දැක්වෙන ලංකාවේ පැවති රාජධානි 02 ක් ලියා දක්වන්න.
v. පහත වචනවලට සමාන පද කවි පන්තියෙන් උපුටා ලියන්න.
   (අ) මැණික් -
   (ආ) පොළව -

(ලකුණු 2 × 5 = 10)

04. ඔබගේ හොඳම මිතුරා/ මිතුරිය වෙනත් පාසලකට අස්වී ගොස් ඇතැයි සිතා ඔහුගේ / ඇයගේ තොරතුරු විමසමින් හා ඔබගේ තොරතුරු දක්වමින් ලිපියක් ලියන්න.

නැතහොත්

ඔබේ මවගේ 40 වැනි උපන්දිනය සඳහා ඇය වෙත ලබාදීමට සුදුසු උපන්දින සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

(ලකුණු 15)

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI

**2019 - දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II පත්‍ර - පිළිතුරු පත්‍රය**

**I කොටස**

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 01 | 3 |
| 02 | 2 |
| 03 | 4 |
| 04 | 2 |
| 05 | 1 |
| 06 | 1 |
| 07 | 2 |
| 08 | 4 |
| 09 | 4 |
| 10 | 3 |
| 11 | 1 |
| 12 | 2 |
| 13 | 1 |
| 14 | 2 |
| 15 | 3 |
| 16 | 4 |
| 17 | 2 |
| 18 | 1 |
| 19 | 3 |
| 20 | 4 |

## II කොටස

01) රචනය

- සාරවත් බව - ලකුණු 07
- සංවිධානය, නිර්මාණාත්මකබව හා ස්වීයත්ව - ලකුණු 10
- ශිල්පීය දක්ෂතා - ලකුණු 03

20

02)

i. a) මාන කොකුන් දෙදෙනා
b) නරි නයිදේ රැවටිච්චී
c) විල සිදී ගොස් කුඩමස්සුන්ගෙන් විල හිස් වූ අවස්ථාවේ. ( 3 x 1 = 3 )

ii. a) බෝධිසත්වයෝ
b) නලපාන ජාතකය
c) කුරුණෑගල යුගය ( 3 x 1 = 3 )

iii. a) අනේ මගේ රන්මුතු වල්ලියා ගොනා
b) ගැල් කවි
c) පතල් කවි / පාරු කවි / පැල් කවි / නෙළුම් කවි ( 3 x 1 = 3 )

iv. a) බිත්තරවලින්
b) ඇවිදින කොළයා
c) විද්‍යා විනෝද කතා ( 3 x 1 = 3 )

v. a) පොරමොලා
b) වීවෙං චුලගොං යමු කිරි නැනෝ
c) වැදි ජනතාව ( 3 x 1 = 3 )

03)

i. සීගිරියේ
ii. ගල් කැටයම්
iii. වැවෙන්
iv. අනුරාධපුර හා පොළොන්නරුව
v. a - රුවන්
b- දෙරණ ( 2 x 5 = 10 )

04) ප්‍රායෝගික ලේඛන

ආකෘතිය - 5
අන්තර්ගතය - 7
ශිල්පීය දක්ෂතා - 3

15

PAST PAPERS WIKI


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440